# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1982/33 - 2016 සැප්තැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2011

**2006 අංක 27 දරන ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනත**

2006 අංක 27 දරන ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනතේ 33 වන වගන්තිය සමග කියවිය යුතු 30 වන වගන්තිය යටතේ සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

රාජිත සේනාරත්න,
සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍ය.

2016 අගෝස්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2016 අංක .................. දරන තහනම් දුම්කොළ නිෂ්පාදන පිළිබඳ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. දුමාරය ඇති නොවන දුම්කොළ නිෂ්පාදන වර්ග මෙහි I වන උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි විය යුතු ය.

3. කිසිදු තැනැත්තකු විසින්, මෙහි I වන සහ II වන උපලේඛනවල සඳහන් කර ඇති යම් දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය, ආනයනය, විකිණීම හෝ විකිණීමට ඉදිරිපත් කිරීම සිදු නොකළ යුතු ය.

4. මේ නියෝගවල -

''දුම රහිත දුම්කොළ නිෂ්පාදනයක්'' යන්නෙන්, යම් දුමාරයක් ඇති නොවන දුම්කොළ නිෂ්පාදනයක් අදහස් වේ.

උපලේඛනය I

(අ) යම් දුම්කොළ අඩංගු දුම රහිත දුම්කොළ නිෂ්පාදනයක් හෝ මිශ්‍රණයක්.

උපලේඛනය II

(අ) යම් පැණි රසගන්වන ලද, වර්ණ ගන්වන ලද හෝ රසගන්වන ලද දුම්කොළ අඩංගු සිගරට්ටුවක් ;

(ආ) යම් දුම්කොළ අඩංගු ඉලෙක්ට්‍රොනික සිගරට්ටුවක්.

09 - 679


1A - PG 3094 — 507 (2016/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*